සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය 2018** — **11 ශ්‍රේණිය**

**முதலாம் தவணைப் பரீட்சை 2018** — **தரம் 11**

**First Term Test 2018** — **Grade 11**

**සිංහල සාහිත්‍ය රසාස්වාදය**

**පැය තුනයි**

**இரண்டு மணித்தியாலம்**

***Three hours***

නම / විභාග අංකය :- ---------------------------------------------------

**1 කොටසේ ප්‍රශ්න සියල්ලට ම ද, 11 කොටසේ 3 වන ප්‍රශ්නයට ද , 111 කොටසේ 4 5 6 7 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න 02 ක් ඇතුළු ව ප්‍රශ්න 5 කට පිළිතුරු ලියන්න**

## 1 කොටස

1 පහත සඳහන් එක් එක් ගද්‍ය කොටස් ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න

1- "ජීවත් ව උනිම් නම් සැපසේ අවුත් දකිනෙම් වේදෑ"

(අ) මෙම ප්‍රකාශය කරන්නේ කවුරුන් විසින් ද?

(ආ) ප්‍රකාශයට අනුව එන බව පවසන්නේ කවුරුන් හමුවීමට ද?

11- "ටිකක් හිටු"

(අ) මෙම ප්‍රකාශය ඇතුළත් සාහිත්‍ය නිර්මාණයේ නම ලියන්න

(ආ) එම සාහිත්‍ය නිර්මාණය උපුටා ගත් මුල් කෘතියේ කතුවරයාගේ නම ලියන්න

111- "අන්න අරෙහෙ කඩේට වෙලා බුදි"

(අ) මෙම ප්‍රකාශය උපුටා ගත් කෘතියේ කතුවරයාගේ නම ලියන්න

(ආ) කඩේට වෙලා නිදා සිටි අය කවු ද?

1v- "ගියත් සුළුගෙයි, වහා එව"

(අ) මෙම ප්‍රකාශය උපුටා ගත් සාහිත්‍ය නිර්මාණය කුමක් ද?

(ආ) එහි මුල් කෘතියේ කතුවරයාගේ නම ලියන්න

V - "නුඹ වහන්සේට විරුද්ධව අවුදින් නුවර වටලා ගත් ශත්‍රැ සේනාව මථනය කොට රජ දරුවන් සත් දෙනා ජීවග්‍රහයෙන් අල්වා ගෙන ආමි"

(අ) ජීවග්‍රහයෙන් යන පදයේ අර්ථය ලියන්න

(අ) සතුරු රජවරුන් ජීවග්‍රහයෙන් අල්වාගෙන ආවේ කවුරුන් ද?

2 දැල් තිර අස්සෙන්
පෙනෙයි ඇ
ඔබ යනු මොබ එනු
පාට පිළී ගෙන අබරණ පෙට්ටි ගෙන

ඇසෙයි නොපෙනෙන විටත්
සාලයෙන් කාමරයට
කාමරයෙන් සාලයට
යන පා හඬ

මා වෙත එතත් ඇ
වුවමනාවක් කිසිත් නැතිව ද
නොරැඳෙයි, පලා යෙයි

ගෑ විලවුනෙහි,
නැත, රන්වන් සමෙහි සුවඳය ඒ
ඇ බඳ සුවඳ
දැනෙන්නේ මට විතරද?

පෙනෙයි ඇ
ඇසෙයි
දැනෙයි
මට ගේ හැම තැන

1 මෙම පද්‍ය පන්තිය රචනා කිරීම සඳහා කතුවරයාගේ අරමුණ වූයේ කුමක් ද? (ලෑ 5)

2 පද්‍ය නිර්මාණය තුළින් කතුවරයා චිත්ත රූප මැවීමට සමත් වී ඇති ආකාරය විස්තර කරන්න (ලෑ 5)

3 අරමුණ සාක්ෂාත් කර ගැනීමට කතුවරයා යොදාගත් ආකෘතිය කොතෙක් දුරට සාර්ථක වී ඇත්දැයි පහදන්න (ලෑ 10)

4 මනාලියගේ ලැජ්ජාශීලී බව ප්‍රකාශ කෙරෙන පද්‍යය උපුටා ලියන්න (ලෑ 5)

## 11 කොටස

3 පහත දැක්වෙන ගද්‍ය හෝ පද්‍ය කොටස් අතුරින් එක් කොටසකට පිළිතුරු ලියන්න

සැවත් නුවර වසන්නා වූ එක්තරා කුල පුත්‍රයෙක් බුදු සස්නෙහි යෙදී මහණව එක් දවසක් සැවත් නුවර පිඬු සිඟා ඇවිදිනේ ය. සර්වාභරණ විභූෂිත වූ එක් මාතගාමයකු දැක සුභ නිමිත්ත ග්‍රහණයෙන් බලා ක්ලේශ වසඟව ශාසනයෙහි ඇලුම් නැතිව දික් වූ නිය කෙස් හා ඉපිලුණු නහරබහන් කිලුටු වූ සිවුරු හා සුදු මැලි වූ සිරුරු ඇතිව වසන්නේ ය. යම් සේ දිව්‍යලෝකයෙන් චුතවන්නා වූ දිව්‍යපුත්‍රයන්ට පැළඳි මල් මලානික වීම ය. දිව සළු කිලුටු වීම ය. ශරීරය දුර්වර්ණයට පැමිණීම ය. දෙකිසිල්ලෙන් ඩා වැහීම ය. දිව්‍ය ලෝකයෙහි ආලය මඳ වීම ය. යන මේ පංච පූර්ව නිමිත්තයෝ පහළ වෙද්ද එපරිද්දෙන් ම උකටලී වූ සිත් ඇති. ශාසනයෙන් පිරිහෙනු කැමති භික්ෂූන්ටත් සැදෑ නැමති මල් මලානික වීම ය , පිළි සිල් කිලිටුවීම ය. කැරවැහැම් හා නුගුණ පැතිරෙමින් විරූප බවට පැමිණීමය. ක්ලේශ නැමති ඩා වැහීමය. විවේකස්ථානයෙහි නො ඇලීම ය. යන පංච පූර්ව නිමිත්තයෝ පහළ වන්නාහ. ඒ මහණ හට ද එකියන ලද පස් වැදෑරුම් වූ ගුණයෝ ද පහළ වූහ. එබව දැන සෙසු භික්ෂූන් වහන්සේ ඒ මහණ නො කැමති කරවා බුදුන් සමීපයට කැඳවා ගොස් "ස්වාමීනී, මූ ශාසනයෙහි උකටලී වූ" යැ යි දැක්වූ සේක.

1 පංච පූර්ව නිමිති වලින් 2 ක් ලියන්න (ලකුණු 05)

2 මෙහි සඳහන් රූපක දෙකක් තෝරා ලියන්න? (ලකුණු 05)

3 සස්නෙහි පිරිහෙන භික්ෂූන් හට පහළ වන පූර්ව නිමිති 2 ක් ලියන්න (ලකුණු 05)

4 කෙලෙස් හේතුවෙන් පිරිහීමට පත් වන භික්ෂූන් වහන්සේලාහට පහළ වන පංච පූර්ව නිමිත්තයන් දිව්‍ය ලෝකයෙන් චුත වන්නා වූ දිව්‍ය පුත්‍රයන්ට පහළ වන පංච පූර්ව නිමිත්තයන්ට සමාන කොට ඇත. එය පහදා දෙන්න (ලකුණු 10)

**නැතහොත්**

" මිනිස් හට සොඳුරු ගුණ සහ නුගුණ ඇත
නිදොස් කෙනෙකු මෙදියත උපදනේ නැත
වෙසෙස් සිනිඳු මුවරඳ බර සහස් පත
කොරොස් නළින් යුතු වෙයි කටු පෙළිනි යුත"

නොමින් ලොව සියලු දේ දක්නා ඇසට
තමන් සැටි මඳක් වත් නොපෙනෙන ලෙසට
අනුන් දොස දකිති අනුවණ දන කපට
එමෙන් සිය නුගුණ නො දකිති නියම කොට

1 මෙලොව උපදින මිනිසා තුළ දක්නට ලැබෙන ලක්ෂණ 2 ක් ලියන්න ( ල 5)

2 එම ලක්ෂණ කවියා උපමා කර ඇත්තේ මොනවාට ද? ( ල 5)

3 සට කපට දනන් තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණය කුමක් ද? ( ල 5)

4 පොදු මිනිස් සමාජයේ දක්නට ලැබෙන දූර්වලතා කවියා අපූර්වත්වයෙන් පෙන්වා දෙන ආකාරය විස්තර කරන්න ( ල 10)

## 111 කොටස

4 කුස ජාතකය පාඨක, ශ්‍රාවක සිත් තුළ හාස්‍ය රසය ජනනය කරන කතා වස්තුවකි නිදසුන් 3 ක් වත් යොදා ගනිමින් පැහැදිලි කරන්න.

5 "සුභාෂිත" කවියා උපදේශ පැහැදිලි කිරීම සඳහා සත්ත්ව චරිත හා එම චරිතවල ක්‍රියාකාරකම් යොදා ගෙන ඇති ආකාරය නිදසුන් 3 ක් වත් දෙමින් විස්තර කරන්න.

6 "වැහි වලාකුළ" පද්‍ය පන්තිය ඇසුරින් කුමාරතුංග කවියා උසස් මානව ගුණ ධර්ම නිරූපණය කරයි ඒවා පහදා දෙන්න.

7 රසවත් කතාවක් ඉදිරිපත් කරන අතර ම ධර්මෝපදේශ ලබා දීමට ද ධර්මසේන හිමියන් දක්වා ඇති කුසලතාව "නන්ද තෙරුන්ගේ වස්තුව" ඇසුරින් පෙන්වා දෙන්න